සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

| 51 | S | I |
|---|---|---|

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Third Term Test - Grade 13 - 2019**

විභාග අංකය .............................

චිත්‍ර I


කාලය පැය තුනයි.
අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

**උපදෙස්**

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.
  - **I කොටස** - වරණ 5 බැගින් බහුවරණ ප්‍රශ්න 40 කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
    - එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 40 කි.
  - **II කොටස** - මෙම කොටස ''අ'', ''ආ'', ''ඉ'' යනුවෙන් අනු කොටස් තුනකින් සමන්විත වේ.
    - ''අ'' කොටසින් ප්‍රශ්න දෙකක් හා ''ආ'', ''ඉ'' යන කොටස් දෙකෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
    - එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලකුණු 60 කි.
- I කොටස හා II කොටසට අදාල පිළිතුරුපත් එකට අමුණා භාර දෙන්න.

## I කොටස

- ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් **A, B, C, D, E** ලෙස නම් කර ඇති කැටයම් ඇතුළත් පින්තූර ඇසුරෙන් තෝරන්න.



**A**



**B**



**C**



**D**



**E**

01. A අක්ෂරයෙන් දැක්වෙන පොලොන්නරු යුගයට අයත් සඳකඩ පහණ සත්ත්ව රූප,
    1. එකා පිටුපස එකා ගමන් කරන සත්ත්වාවලියක් ලෙස නිරූපිතය.
    2. ඇතා, අශ්වයා, ගවයා, සිංහයා සහ හංසයා යන සතුන්ගෙන් සමන්විත වේ.
    3. බෞද්ධ ආගමික සංකල්ප අර්ථවත් වන ලෙස යොදා ඇත.
    4. සතුන් වෙන් වෙන් තීරුවල ගමන් කරන ආකාරයට යොදා ඇත.
    5. සත්ත්ව රූප සහිත ලාංකීය කැටයම් අතුරින් ප්‍රශස්ථතම අවස්ථාව වේ. (.......)

02. B අක්ෂරයෙන් දැක්වෙන ආකාරයේ පිහිටි ගලේ ස්වභාවය උපයෝගී කොටගත් කැටයම් හඳුනාගත හැකි වන්නේ,
    1. ඉන්දියාවේ අමරාවතී සම්ප්‍රදාය තුළ ය.
    2. ඉන්දියාවේ පල්ලව සම්ප්‍රදාය තුළ ය.
    3. ඉන්දියාවේ ගන්ධාර සම්ප්‍රදාය තුළ ය.
    4. ඉන්දියාවේ චෝළ සම්ප්‍රදාය තුළ ය.
    5. ඉන්දියාවේ ගුප්ත යුගය තුළ ය. (.......)

03. C අක්ෂරයෙන් දැක්වෙන අමරාවතී කැටයමේ සුවිශේෂී ලක්ෂණයක් වන්නේ,
1. කථා වස්තුවක් අනුපිලිවෙළින් ගලායන ආකාරයට අඛණ්ඩ කථන ක්‍රමය භාවිතයයි.
2. කථා වස්තුවේ උච්ඡතම අවස්ථාව නිරූපණය කිරීමයි.
3. කථා වස්තුවේ සිදුවීම් කිහිපයක් එකම තලය මත නිරූපණය යි.
4. කථා වස්තුවට අදාල නොවන කාරණා ද නිරූපණය කිරීමයි.
5. කථා වස්තුව යථාර්ථවාදී ලෙස සම්පිණ්ඩනය කිරීමයි. (.......)

04. D අක්ෂරයෙන් දැක්වෙන රන් කාසිය,
1. කුෂාණ පාලනය යටතේ වයඹ දිග ඉන්දියාවේ ඇතිවූ ආර්ථික දියුණුවට නිදසුනකි.
2. ගන්ධාර දේශය හා විදෙස් සබඳතා පැවති බවට සාධකයකි.
3. ක්‍රි.ව. 2 සියවසේ දී පමණ ඉන්දියාවේ කාසි භාවිතය ආරම්භ වූ බවට නිදසුනකි.
4. කාසි සඳහා රජවරුන්ගේ රූප භාවිතය තහවුරු කරන සාධකයකි.
5. බුදුරුව නිර්මාණය ආරම්භය පිළිබඳ සාක්ෂියකි. (.......)

05. E අක්ෂරයෙන් දැක්වෙන කැටයමින්,
1. ඊජිප්තු යුධ ජයග්‍රහණයක් පිළිබඳ තොරතුරු නිරූපණය වේ.
2. ඊජිප්තු දේව සංකල්පයකට අදාල කථා පුවතක් දැක්වේ.
3. ඊජිප්තු ආගමික චාරිත්‍රයක් දැක්වේ.
4. ජන ජීවිතය හා බැඳුනු සිදුවීමක් නිරූපණය වේ.
5. මිථ්‍යා සංකල්පයක් නිරූපණය වේ. (.......)

- ප්‍රශ්න අංක 6 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි** පිළිතුර තෝරන්න.

06. නාන කාමරයකට උචිත බිම් ඇතිරුම් ගලක් සැලසුම් කිරීමේ දී එහි පාරිසරික ගුණාංග අතුරින් වඩාත් අවධානය යොමු කළ යුත්තේ,
1. වර්ණය පිළිබඳව ය. 2. වයනය පිළිබඳව ය. 3. අමුද්‍රව්‍ය පිළිබඳව ය.
4. පිරිවැය පිළිබඳව ය. 5. පාරිභෝගිකයින් පිළිබඳව ය. (.......)


07. විවිධ ද්‍රව්‍යයන් හා වස්තූන් එක් කරමින් මූර්ති නිර්මාණය,
1. ඇඹීම වේ. 2. නෙලීම වේ. 3. වාත්තු කිරීම වේ.
4. ස්ථාපනය කිරීම වේ. 5. එකලස් කිරීම වේ. (.......)

08. චිත්‍ර ශිල්පියෙකු මානව සිරුරෙහි අභ්‍යන්තර ව්‍යුහයක් (ANATOMMY) අධ්‍යනය කළයුතු වන්නේ,
1. එළිය අඳුර දැක්වීමේ දී වැදගත් වන නිසා ය.
2. එය චිත්‍ර ශිල්පියෙකු තුළ තිබිය යුතු අනිවාර්ය ගුණාංගයක් නිසා ය.
3. අභ්‍යන්තර ව්‍යුහයන් බාහිර පෙනුමට වඩා සංකීර්ණ බැවිනි.
4. බාහිර ස්වරූපය අභ්‍යන්තර ව්‍යුහය මත රඳා පවතින නිසා ය.
5. ඉපැරණි ශිල්පීන් විසින් ද මෙම ක්‍රමය අනුගමනය කළ නිසා ය. (.......)

09. ඇඳුම් විලාසිතා සඳහා මානව රූප ඇඳීමේ දී,
1. සාමාන්‍ය මානව රූපයක පරිමාණ භාවිතා කළ යුතුය.
2. සාමාන්‍ය මානව රූපයක මාංශ පේශී අවධාරණය කළ යුතුය.
3. පරමාදර්ශී මානව රූපය භාවිතා කළ යුතුය.
4. සාමාන්‍ය මානව රූපයට වඩා උසින් වැඩිවන ලෙස පරිමාණුකූලව වෙනස් කළ යුතුය.
5. සාමාන්‍ය මානව පරිමාණ වලින් යුත් ආකෘතික හැඩ පමණක් භාවිතා කළ යුතුය. (.......)

10. සිතුවම්කරණයේ දී උපස්ථිතිවාදී ශිල්පීන්ගේ කේන්ද්‍රීය අවධානය යොමු වූ දෘශ්‍ය කලා මූලිකාංගය ලෙස,
1. හැඩය දැක්විය හැකි ය . 2. ආකෘතිය දැක්විය හැකි ය. 3. රේඛාව දැක්විය හැකිය.
4. අවකාශය දැක්විය හැකි ය. 5. වර්ණය දැක්විය හැකි ය. (.......)

- අංක 11 සිට 15 තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි** පිළිතුර පහත අංක 1 සිට 8 දක්වා නම් කර ඇති ඡායාරූප ඇසුරු කරගෙන තෝරන්න.



**1**



**2**



**3**




**4**




**5**



**6**



**7**



**8**

11. ඒකවාර්ණික ස්වරූපයක් සහිත සිතුවම් වන්නේ,
1. 2,7 2. 8,3 3. 5,6 4. 5,3 5. 2,8 (.......)

12. ශිල්පියාගේ භාවමය ආවේශයන්ට මූලිකත්වය දෙමින් වස්තු විෂයයක් නිරූපණයෙන් බැහැර වූ ව්‍යුක්ත සිතුවම් වන්නේ,
1. 1,4,7 2. 2,4,6 3. 5,7,1 4. 3,5,6 5. 1,4,8 (.......)

13. විස්තරාත්මක තොරතුරු බැහැර කරමින් චිත්‍රයේ මූලිකාංගයන් සරලීකරණයට ලක්කොට ඇති සිතුවම් වන්නේ,
1. 8,5,3 2. 3,2,7 3. 6,7,8 4. 2,4,6 5. 5,1,4 (.......)

14. සංස්ලේෂණාත්මක ඝනිකවාදී උපක්‍රම භාවිතා කොට ඇති සිතුවම් වන්නේ,
1. 3,4 2. 2,3 3. 1,5 4. 1,2 5. 2,8 (.......)

15. යථාලෝකයෙන් ඔබ්බට ගමන් කරමින් අවිඥානිකත්වය හා බැඳුන සංකල්ප විවරණය කරන සිතුවම් වන්නේ,
1. 3,6 2. 5,3 3. 6,2 4. 5,8 5. 7,6 (.......)

- අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට **වඩාත් නිවැරදි** පිළිතුර තෝරන්න.

16. ආසියාතික ආගමික තේමාවන් යුරෝපීය ශෛලීන් ඔස්සේ චිත්‍රණය කරන ලද්දේ,
1. ඩේවිඩ් පේන්ටර් සහ ජෝර්ජ් කීට් විසිනි. 2. අම්රිතා ශර්ගිල් සහ L.T.P. මංජුශ්‍රී විසිනි.
3. A.C.G.S. අමරසේකර සහ සෝලියස් මැන්දිස් විසිනි. 4. ඇම් සාර්ලිස් සහ රවී වර්මා විසිනි.
5. සෝමබන්දු විද්‍යාපති සහ එච්.ඒ. කරුණාරත්න විසිනි. (.......)

17. පර්යාවලෝකය, රූප විස්තරාත්මකව ඇඳීම, සියුම් රේඛාකරණය, උචිත වර්ණ සංකලනය සහ සමස්ත චිත්‍ර සම්පිණ්ඩනය ම මොස්තරානුකූල බව,
1. රාජ්පුට් කලාව තුල නිරීක්ෂණය කළ හැකි ය.
2. මෝගල් කලාව තුල නිරීක්ෂණය කළ හැකිය.
3. මහනුවර ශෛලිය තුළ නිරීක්ෂණය කළ හැකිය.
4. පෙරදිග සම්භාව්‍ය ශෛලිය තුළ නිරීක්ෂණය කළ හැකිය.
5. මිසර චිත්‍ර කලාව තුළ නිරීක්ෂණය කළ හැකිය. (.......)

18. ඉන්දීය ගුප්ත යුගය තුළ නිර්මාණය වූ බුද්ධ ප්‍රතිමා
1. බුදුරජාණන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණ මනාව දක්වා ඇත.
2. විදේශීය බලපෑමට ලක්ව ඇත.
3. සරල බවකින් හා ගැඹුරු අධ්‍යාත්මික ප්‍රකාශනයකින් යුතුය.
4. ප්‍රතිමා මූලධර්ම අකුරට අනුගමනය කරමින් නිර්මාණය කොට ඇත.
5. ස්වභාවික හැඩතල වෙත නැඹුරු වෙමින් නිර්මාණය කොට ඇත. (.......)

19. කතළුව පූර්වරාමයේ සිතුවම් ඇඳි සිත්තර පරපුර වන්නේ,
1. නීලගම සිත්තර පරපුර
2. කඩොල්ගල්ල සිත්තර පරපුර
3. දේවේන්ද්‍ර මූලාචාරීන්ගේ සිත්තර පරපුර
4. දෙල්මඩ සිත්තර පරපුර
5. පිළිමතලාවේ සිත්තර පරපුර ය. (.......)

20. මයිකල් ඇන්ජලෝ ශිල්පියාගේ සිතුවම්වල හඳුනාගතහැකි. සුලභ ලක්ෂණයක් වන්නේ,
1. අතිශෝක්තියෙන් කාය ව්‍යුහ ලක්ෂණ දැක්වීමයි.
2. මනා සම්පිණ්ඩනයයි.
3. රේඛීය පර්යාවලෝකනය භාවිතයට ගැනීමයි.
4. විචිත්‍ර වර්ණ භාවිතය යි.
5. යථාර්ථවාදී තේමා පමණක් ඇඳීම. (.......)

- **ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට ඊට ඉදිරියෙන් ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**


21. මෙහි දැක්වෙන ලෝවාමහාපාය නමැති වාස්තු විද්‍යා නිර්මාණය,
1. පධානඝරයකි.
2. බෝධිඝරයකි.
3. උපෝසථඝරයකි.
4. ජන්තාඝරයකි.
5. ආසනඝරයකි. (.......)



22. මෙහි දැක්වෙන ගොඩනැගිල්ල භාවිත කොට ඇත්තේ,
1. පිරිත් ශ්‍රවණය සහ දලඳා වහන්සේ වැඩ පුදා ගැනීම සඳහාය.
2. විනය කර්ම හා පොහොය කර්ම සිදු කිරීමටය.
3. භික්ෂූන් වහන්සේලාගේ ස්නානය සහ සනීපාරක්ෂාව සඳහාය.
4. භික්ෂූන් වහන්සේලාගේ රැස්වීම් ශාලාවක් වශයෙනි.
5. ධර්ම දේශනා මණ්ඩපයක් වශයෙනි. (.......)



23. මෙහි දැක්වෙන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සඳහා බහුල වශයෙන් යොදාගෙන ඇති මාධ්‍ය වන්නේ,
1. ස්ටකෝ බදාම සහ ගඩොල්ය.
2. ඩයොරයිට් පාෂාණය.
3. ඇලබැස්ටර් පාෂාණය.
4. ග්‍රැනයිට් පාෂාණය.
5. සුදු කිරි ගරුඬය. (.......)



24. මෙහි දැක්වෙන පාතිනොන් දේවස්ථානය නිර්මාණය කිරීමේ දී ,
1. අයොනික් කුළුණු භාවිත කොට ඇත.
2. කොරින්තියන් කුළුණු භාවිත කොට ඇත.
3. ඩොරික් සම්ප්‍රදායේ කුළුණු භාවිත කොට ඇත.
4. පැපිරස් කුළුණු භාවිත කොට ඇත.
5. පර්සියානු ලක්ෂණ සහිත කුළුණු භාවිතා කොට ඇත. (.......)



25. මෙහි දැක්වෙන රෝම විජයග්‍රහණ ආරුක්කුව,
1. ටයිටස් අධිරාජ්‍යයාගේ යුධ ජයග්‍රහණ සිහිවීම පිණිස ඉදිකර ඇත.
2. කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යයාගේ යුධ ජයග්‍රහණ සිහිවීම පිණිස ඉදිකර ඇත.
3. මාකස් ඕරුලියස් අධිරාජ්‍යයාගේ යුධ ජයග්‍රහණ සිහිවීම පිණිස ඉදිකර ඇත.
4. සෙප්ටිමස් අධිරාජ්‍යයාගේ යුධ ජයග්‍රහණ සිහිවීම පිණිස ඉදිකර ඇත.
5. ඔගස්ටස් සීසර් අධිරාජ්‍යයාගේ යුධ ජයග්‍රහණ සිහිවීම පිණිස ඉදිකර ඇත.(.......)





- **ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුරු පහත සඳහන් F, G, H, I, J ලෙස නම් කර ඇති මූර්ති ඇසුරින් තෝරන්න.**


F


G


H


I


J

26. F අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය කෙරෙහි,
   1. අනුරාධපුර මුල් භාගය තුල ක්‍රියාත්මක වූ ථේරවාද බෞද්ධ සංකල්ප බලපා ඇත.
   2. අනුරාධපුර අවසාන භාගයේ ක්‍රියාත්මක වූ පල්ලව බලපෑම ලැබී ඇත.
   3. පොළොන්නරු යුගයේ දී ව්‍යාප්ත වූ හින්දු ආගම බලපා ඇත.
   4. අනුරාධපුර අවසන් භාගයේ ක්‍රියාත්මක වූ මහායාන සංකල්ප බලපා ඇත.
   5. ශ්‍රී ලංකාවේ පැවති ජෛන බලපෑම ලැබී ඇත. (.......)


27. G අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය නිර්මාණය කල තිස්ස රණසිංහ,
   1. ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික මූර්ති කලාව අනුගමනය කොට ඇත.
   2. දකුණු ඉන්දීය හින්දු ආගමික මූර්ති කලාවෙන් ආභාසය ලබා ඇත.
   3. යුරෝපීය නූතන මූර්ති කලාව සහ ආසියාතික සංකල්ප ඔස්සේ මූර්ති නිර්මාණය කර ඇත.
   4. එතෙක් පැවති මූර්ති සම්ප්‍රදායන් බැහැර කොට ඇත.
   5. මූර්ති කලාව තුල එකලස් කිරීමේ කලාව මූලික කරගෙන ඇත. (.......)

28. H අක්ෂරයෙන් දැක්වෙන චෝල මූර්තිය,
   1. සෞන්දර්‍යයාත්මක වේ. 2. ප්‍රකාශනාත්මක වේ. 3. යථාර්තවාදී වේ.
   4. නිරූපණාත්මක වේ. 5. ස්වභාවිකවාදී වේ. (.......)

29. I අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය නිර්මාණය කර ඇත්තේ,
   1. ඇන්ටිසොව් විසිනි. 2. පොලිඩෝරස් විසිනි. 3. පීඩියස් විසිනි.
   4. ප්‍රැක්සිටෙලස් විසිනි. 5. පොලික්ලිටස් විසිනි. (.......)

30. J අක්ෂරයෙන් දැක්වෙන රෝම මූර්ති කලාවේ විශේෂ ලක්‍ෂණයක් ලෙස,
   1. පුද්ගල අනන්‍යතා ලක්‍ෂණ නිරූපණය දැක්විය හැකිය.
   2. පරමාදර්ශී ලක්‍ෂණ නිරූපණය දැක්විය හැකිය.
   3. යථාර්තවාදී ලක්‍ෂණ නිරූපණය දැක්විය හැකිය.
   4. මානව වාදී ලක්‍ෂණ නිරූපණය දැක්විය හැකිය.
   5. සම්භාව්‍ය කලා ලක්‍ෂණ නිරූපණය දැක්විය හැකිය. (.......)

- **ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් අසා ඇති ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර K, L, M, N, O ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරින් තෝරන්න.**


**K**


**L**


**M**


**N**


**O**

31. K අක්ෂරයෙන් දැක්වෙන සිතුවම ඇඳි ශිල්පියා,
   1. මංජු ශ්‍රී ය. 2. ජෝර්ජ් කීට්ය. 3. සෝලියස් මෙන්දිස්ය.
   4. M. සාර්ලිස් ය. 5. සෝමබන්දු විද්‍යාපතිය

32. L අක්‍ෂරයෙන් දැක්වෙන සිතුවම ඇඳි ශිල්පියා,
   1. පෙරදිග සම්භාව්‍ය ශෛලියට එරෙහි වී ඇත.
   2. ශාස්ත්‍රාලීය යථාර්ථවාදී ලක්‍ෂණ බැහැර කොට ඇත.
   3. ශාස්ත්‍රාලීය යථාර්ථවාදී ලක්‍ෂණ අනුගමනය කර ඇත.
   4. පෙරදිග සම්භාව්‍ය ශෛලිය අනුගමනය කර ඇත.
   5. ජන කලා ශෛලියෙන් ආභාසය ලබා ඇත. (.......)

33. M අක්‍ෂරයෙන් දැක්වෙන නව කැලණි විහාරයේ සිතුවම් අතර,
   1. ශ්‍රී ලංකාවේ ශාසන ඉතිහාසය චිත්‍රයට නගා ඇත.
   2. බෞද්ධ ජාතක කථා සඳහා ප්‍රමුඛත්වය ලබා දී ඇත.
   3. බුද්ධ චරිතය පමණක් නිරූපණය කොට ඇත.
   4. දඹදිව සිදු වූ සිදුවීම් චිත්‍රයට නගා ඇත.
   5. ඉන්දීය ශාසන ඉතිහාසය චිත්‍රයට නගා ඇත. (.......)

34. N අක්ෂරයෙන් දැක්වෙන පාලනය කල ඉරියව් වෙනුවට නිදහස් ඉරියව් ඇසුරින් චිත්‍ර නිර්මාණය කරන ලද්දේ,
   1. පෝල් සෙසාන්ය.   2. වින්සන්ට් වැන්ගෝ විසිනි.   3. මේරි කසාට් විසිනි.
   4. එඩ්ගා ඩෙගා විසිනි.   5. ක්ලොඩ් මොනේ විසිනි.   (.......)

35. O අක්ෂරයෙන් දැක්වෙන සිතුවමේ විශේෂ ලක්ෂණයක් වන්නේ,
   1. ආලෝකය අනුව වර්ණයේ ක්‍රියාකාරීත්වය දැක්වීමයි.
   2. බහුවිධ දෘෂ්ඨි කෝණයන් එකම තලයක නිරූපණය කිරීමයි.
   3. හැඩතල විකෘත කොට දැක්වීමයි.
   4. සීමිත හැඩතල ප්‍රමාණයක් භාවිතා කිරීමයි.
   5. වර්ණයට වඩා හැඩතල අවධාරණය කිරීමයි.   (.......)

- **ප්‍රශ්ණ අංක 36 සිට 40 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.**



36. මෙම සිතුවම් කොටස දැකගත හැකි වන්නේ,
   1. දෙගල්දොරුව විහාරස්ථානයෙනි.   2. හිඳගල විහාරස්ථානයෙනි.   3. දඹුල්ල විහාරස්ථානයෙනි.
   4. රිදී විහාරයෙනි.   5. කතළුව පූර්වාරාම විහාරයෙනි.   (.......)

37. මෙම සිතුවමින් නිරූපණය වන්නේ,
   1. බුදුන් වහන්සේ අසුරයින් දමනය කල අවස්ථාවයි.
   2. බුදුන් වහන්සේ නිරයට වැඩම කල අවස්ථාවයි.
   3. බුදුන් වහන්සේ ආලවක යක්ෂයා දමනය කරන අයුරුය.
   4. බුදුන් වහන්සේ යක්ෂයින් දමනය කිරීමට මහියංගනයට වැඩම කිරීමයි.
   5. බුදුරජාණන් වහන්සේ මාරයින් පරාජය කර බුද්ධත්වයට පත්වීමයි.   (.......)

38. මෙම සිතුවමේ බුදුරජාණන් වහන්සේ වෙතින්,
   1. අභය මුද්‍රාව දැක්වේ.   2. භූමි ස්පර්ශ මුද්‍රාව දැක්වේ.   3. කටක හස්ත මුද්‍රාව දැක්වේ.
   4. විතර්ක මුද්‍රාව දැක්වේ.   5. ධ්‍යාන මුද්‍රාව දැක්වේ.   (.......)

39. මෙම සිතුවම ඇති විහාරස්ථානයේ ඉතා සවිස්තරාත්මක ලෙස නිරූපණය කොට ඇති ජාතක කථාවක් වන්නේ,
   1. තේමිය ජාතක කථාවයි.   2. ඡද්දන්ත ජාතක කථාවයි.   3. උරග ජාතක කථාවයි.
   4. වෙස්සන්තර ජාතක කථාවයි.   5. තේලපත්ත ජාතක කථාවයි.   (.......)

40. මෙම සිතුවම තුල හඳුනාගත හැකි ලක්ෂණ ලෙස,
   1. රේඛාව කේන්ද්‍රීයව ද්විමාන ලෙස වර්ණ ගන්වා ඇත.
   2. පර්යාවලෝක ලක්ෂණ සහිතව රූප විස්තරාත්මක කර ඇත.
   3. රිද්මයානුකූල ඉරියව් හා තාත්වික රූප භාවිත කර ඇත.
   4. ස්වභාවික හැඩතල හා ත්‍රිමාණ ලක්ෂණ දක්වා ඇත.
   5. අඛණ්ඩ කථන ක්‍රමය සහ රූපවල පරිමාණ ලක්ෂණ නිවැරදිව දක්වා ඇත.   (.......)

# 13 ශ්‍රේණිය - චිත්‍ර I

## II කොටස

- ''අ'' කොටසින් ප්‍රශ්න දෙකක් හා ''ආ'', ''ඉ'' යන කොටස් දෙකෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

## 'අ' කොටස

## සංස්කෘතික පසුබිම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව

01. ශ්‍රී ලංකාවේ බෞද්ධ චිත්‍ර කලාවට ඉමහත් මෙහෙවරක් කළ චිත්‍ර ශිල්පියෙකු ලෙස එම්. සාර්ලිස් හැඳින්විය හැකිය. ස්වභාවික හැඩතල හා පැහැපත් වර්ණ රටා භාවිතා කිරීම නිසා පොදු ජනයාගේ සිත් ගන්නට සමත් වූ ශිල්පියෙකි.

    i. කොළඹ යුගයේ ශිල්පියෙකු වූ එම් සාර්ලිස් ගේ සිතුවම් දෙකක් නම් කරන්න. (ල. 2)

    ii. එම්. සාර්ලිස් ගේ නිර්මාණවල කලා ලක්ෂණ විස්තර කරන්න. (ල. 5)

    iii. කොළඹ යුගයේ අසහාය කලා ශිල්පීන් ලෙස ජනතාවගේ සිත් තුල අමරණීය වූ සෝලියස් මැන්දිස් හා සෝමබන්දු විද්‍යාපති ශිල්පීන්ගේ නිර්මාණවල ශෛලිය ලක්ෂණ පිළිබඳ සන්සන්දනාත්මක ඇගයීමක් කරන්න. (ල. 8)

02. පොළොන්නරු යුගයේ බුදු පිළිම පිළිබඳ විමසීමේ දී, සුවිශේෂී බවක් දැකිය හැක. මේ සඳහා අනුගමනය කර ඇති ශෛලීන් ද ප්‍රතිමාවල විකාශනය සහ ඒ සඳහා බලපා ඇති දාර්ශනික සිතුවිලිද විශේෂය.

    i. පොළොන්නරු යුගයට අයත් බුදු පිළිම දෙකක් නම් කරන්න. (ල. 2)

    ii. පොළොන්නරුවේ පොත් ගුල් විහාර ප්‍රතිමාව පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල. 5)

    iii. ගම්පොළ හා මහනුවර යුගයේ බුදු පිළිම නිර්මාණය සඳහා භාවිතා කර ඇති මාධ්‍ය, ශිල්ප ක්‍රම හා කලාත්මක ලක්ෂණ පිළිබඳව විචාරත්මක ඇගයීමක් කරන්න. (ල. 8)

03. ශ්‍රී ලංකාවේ බෞද්ධ ගෘහ නිර්මාණ අතර චෛත්‍යයට ප්‍රධාන තැනක් හිමිවේ. බුදුරජාණන් වහන්සේගේ හා රහතන් වහන්සේලාගේ ශාරීරික හා පාරිභෝගික ධාතූන් වහන්සේලා තැන්පත් කර නිමවා ඇති පූජනීය ස්මාරකයක් ලෙස ද චෛත්‍යය හැඳින්විය හැකිය.

    i. ශ්‍රී ලංකාවේ ඓතිහාසික ස්ථූප දෙකක් නම් කරන්න. (ල. 2)

    ii. අනුරාධපුර යුගයේ ඉදි වූ චෛත්‍යය හා ඒ ආශ්‍රිත සුවිශේෂ කලා නිර්මාණයක් වූ ''වාහල්කඩ'' ලෙස හඳුන්වන නිර්මාණ අංගය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ල. 5)

    iii. ''සඳකඩ පහණ'' නමැති කැටයම් බහුල අලංකාර ගල් පුවරුවේ විකාශනය පිළිබඳ විස්තර කර පොළොන්නරු හා මහනුවර යුගවල සඳකඩ පහණ, අනුරාධපුර යුගයේ සඳකඩ පහණ හා සසඳමින් කලාත්මක ඇගයීමක් කරන්න. (ල. 8)

## 'ආ' කොටස

## සංස්කෘතික පසුබිම හා රසාස්වාදය - ඉන්දියාව

04. ඉන්දියාවේ යමුනා ගඟබඩ මථුරා නගරය කේන්ද්‍ර කොටගෙන ක්‍රි.ව. 01 වන සියවසේ දී පමණ මථුරා කලා සම්ප්‍රදාය බිහිවී ඇත. පැරණි ඉන්දීය කලාවේ යක්ෂ - යක්ෂණී රූපවල ආභාසයෙන් දේශීය මානව ලක්ෂණ සහිතව බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීමට මථුරා ශිල්පියා සමත් විය.

i. මථුරා බුදු පිළිමවල කලා ලක්ෂණ දෙකක් නම් කරන්න. (ල. 2)

ii. ඉන්දියාවේ සාංචි තොරණ්හි කැටයම්වලට වඩා සියුම් බවින්ද, මටසිලිටි කමනීය ලාලිත්‍යමය ස්වභාවය හා සජීවී බවින් යුත් අමරාවතී කැටයම් පිළිබඳ විස්තරයක් කරන්න. (ල. 5)

iii. ඉන්දියාවේ ආන්ද්‍ර දේශයේ පිහිටි ප්‍රධාන සංස්කෘතික මධ්‍යස්ථානයක් වූ අමරාවතිය කේන්ද්‍ර කොටගෙන බිහි වූ අමරාවතී කලා කෘති අතර ඇති නාලාගිරි දමනය, රාහුල කුමරු දායාද ඉල්ලීම, අභිනිෂ්ක්‍රමණය කැටයම්වල ශිල්ප ක්‍රම, භාව ප්‍රකාශනය ආදිය පිළිබඳව සැලකිලිමත් වෙමින් විවේචනාත්මක විමර්ශනයක් ඉදිරිපත් කරන්න. (ල. 8)

05. මධ්‍යම ආසියාවේ සිට සංක්‍රමණය වූ ග්‍රීක සම්භවයක් සහිත කුෂාණ වංශිකයෝ ක්‍රි.ව. 1-5 සියවස් අතර කාලයේ ගාන්ධාරය පාලනය කලහ. කුෂාණයන් බුදු දහම වැළඳගැනීම සහ ඔවුන්ගේ ග්‍රීක රෝම හා ඉන්දීය ලක්ෂණ මිශ්‍රිත නව කලා ආරක් ගාන්ධාරය තුළ බිහි විය.

i. ගන්ධාර සම්ප්‍රදායට අයත් කලා කෘති දෙකක් නම් කරන්න. (ල. 2)

ii. ගන්ධාර ප්‍රතිමාවල කලා ලක්ෂණ පහදන්න. (ල. 5)

iii. ගාන්ධාර ප්‍රතිමා හා මථුරා බුද්ධ ප්‍රතිමාවන්හි භාව ප්‍රකාශනය හා කලාත්මක ලක්ෂණ සන්සන්දය කරමින් ඇගයීමක් කරන්න. (ල. 8)

## 'ඉ' කොටස

## සංස්කෘතික පසුබිම හා රසාස්වාදය - යුරෝපය

06. නූතනවාදී මූර්ති බිහි කිරීමේ ලා වඩා වැදගත්ම දායකත්වයක් සැපයූ ප්‍රංශ ජාතික ඔගුස්ට් රොඩෑං උපස්ථිතිවාදී කලා ව්‍යාපාරයට සමගාමීව නිර්මාණකරණයේ නියැලුණු අයෙකි.

i. රොඩෑං විසින් නිම කරන ලද මූර්ති දෙකක් නම් කරන්න. (ල. 2)

ii. එම නිර්මාණවල කලාත්මක ලක්ෂණ පිළිබඳ ඇගයීමක් කරන්න. (ල. 5)

iii. ඔගුස්ට් රොඩෑංගේ නිර්මාණවල ස්වභාවිකවාදී බව සහ විසිවන සියවසේ නූතනවාදී මූර්තියේ වියුක්තවාදී ගමන් මඟ සඳහා දායක වූ හෙන්රි මුවර් ශිල්පියාගේ වියුක්තවාදී බව පිළිබඳ සංසන්දනාත්මක ඇගයීමක් කරන්න. (ල. 8)

07. වියුක්තවාදී කලාකරුවෝ ස්වභාව ධර්මය හෝ එහි වස්තූන් හෝ ඒ ආකාරයෙන්ම අනුකරණය හෝ නැවත ප්‍රතිනිර්මාණය අතහැර දැමූහ.

i. වියුක්තවාදී කලා ප්‍රවණතාවේ පුරෝගාමී වූ එවන් චිත්‍ර ශිල්පීන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 2)

ii. ''සංරචනය'' හා ''කෝණ අංක 247'' චිත්‍රවල දැක්වෙන සුවිශේෂ ලක්ෂණ පිළිබඳ විස්තර කරන්න. (ල. 5)

iii. වියුක්තවාදී කලා නිර්මාණ අතර දක්නට ඇති ''කහ, කළු, නිල්, රතු සහ අළු සංයෝජනය'' චිත්‍රය සහ ''රතු, නිල් සහ කහ සංයෝජනය II'' යන චිත්‍ර දෙකෙහි ඇති සමානතා, සුවිශේෂතා ආදිය පිළිබඳ ඔබේ අදහස් දක්වමින් විවේචනාත්මක ඇගයීමක් කරන්න. (ල. 8)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved



තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

Third Term Test - Grade 13 - 2019

විභාග අංකය .............................

චිත්‍ර II

කාලය පැය තුනයි

**අයදුම්කරුවන්ට උපදෙස්**

- **ඔබේ නම/විභාග අංකය ඔබ චිත්‍රය අඳින කඩදාසියේ පසුපිටේ පැහැදිලිව ලියන්න.**
- **ඔබේ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට එය වියළී තිබීම වැදගත්ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින්, එය ඔබට අවාසි විය හැකිය.**
- **ඔබ කැමති ඕනෑම මාධ්‍යක් භාවිතා කිරීමට නිදහස ඇත.**
  **මාධ්‍යය :- දියසායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් හෝ මෙම මාධ්‍ය මිශ්‍රිතව හෝ භාවිත කිරීමට නිදහස ඇත.**

## ස්වභාවිකත්ව අධ්‍යයනය හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය

- පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන ඔබ ඉදිරියේ තබා ඇති පැලෑටිය සහිත ද්‍රව්‍ය සමූහය ඇඳ, වර්ණ කරන්න.

1. කඩදාසි තලය අර්ථවත්ව භාවිත කරමින් චිත්‍රය සම්පිණ්ඩනය කරන්න.
2. ද්‍රව්‍යවල හා පැළෑටියේ ගති ලක්ෂණ, මතුපිට ස්වභාවය, පරිමාණය ඇස් මට්ටම, ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාලෝක රීති පිළිබඳව සැලකිලිමත් වන්න.
3. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන ආකාරයට ඇඳ, ඒ මත ආලෝකය හා අඳුර පතිත වී ඇති අයුරු සැලකිල්ලට ගෙන වර්ණ කරන්න.
4. වර්ණ මාධ්‍ය හැසිරවීමේ ශිල්පක්‍රම අර්ථවත්ව භාවිත කරන්න.
5. ද්‍රව්‍ය සමූහයට ගැලපෙන වර්ණවත් පසුබිමක් යොදන්න.
6. ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සම්පිණ්ඩනයට ගැලපෙන පරිදි වෙනස් කර ගැනිමට හැකිය.
7. දියසායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් හෝ මෙම මාධ්‍ය මිශ්‍රිතව හෝ භාවිත කළ හැකිය.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

51 S III

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

Third Term Test - Grade 13 - 2019

විභාග අංකය .............................

# චිත්‍ර III

කාලය පැය තුනයි

- පහත සඳහන් 'අ' , 'ආ' සහ 'ඉ' කොටස් තුනෙන් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.
- ඔබේ විභාග අංකය හා තෝරාගත් ප්‍රශ්න අංකය ඔබ චිත්‍රය අඳින කඩදාසියේ පසුපිටේ පැහැදිලි ව ලියන්න.
- චිත්‍රය භාර දෙන විට එය වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින් එය ඔබට අවාසි විය හැකිය.
- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල්, කුඩු සායම් යන මාධ්‍ය මිශ්‍රිතව භාවිතා කිරීමට නිදහස ඇත.

## 'අ' කොටස - චිත්‍ර සංරචනය

01. කඳුකර ප්‍රදේශයක කඳුකර මාර්ගයක් අසබඩ පිහිටි කුඩා කඩමණ්ඩියක්.
02. පැදුරු විවීමේ නිරතව සිටින ගැමි කාන්තාවන් පිරිසක්
03. ගමේ පිරිස එකමුතු වී දහවල් කාලයේ පවත්වන වෙසක් දන්සල
04. සිද්ධස්ථානයක ආගමික වතාවත්වල නිරතව සිටින බැතිමතුන්

## 'ආ' - මෝස්තර නිර්මාණය

05. සංස්කෘතික මධ්‍යස්ථානයක රබන් කණ්ඩායම සඳහා උචිත ඇඳුම් කට්ටලයක් සාම්ප්‍රදායික උද්භිද සැරසිලි ඒකක ඇසුරු කරගෙන නිර්මාණය කරන්න. ඔබට අභිමත වර්ණ මාලාවක් භාවිතා කරන්න.
06. ශ්‍රී ලංකාවේ සිට යුරෝපය වෙත පියාසර කරන නවතම ගුවන් සේවාවක ගුවන් සේවිකාවන්ගේ රන්වන් පැහැති නිල සාරියෙහි අඟල් 5ක ප්‍රමාණයේ බෝඩරය නිර්මාණාත්මක ඒකකයක් යොදා නිර්මාණය කරන්න.
07. සමචතුරස්‍රාකාර කුෂන් කවරයක් මැසීමට යොදාගන්නා මුද්‍රිත රෙද්දක් සඳහා සුදුසු ව්‍යුක්ත හැඩතල යෙදූ මුද්‍රිත රෙද්දකට ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න. PRUSSIAN නිල් වර්ණය හෝ VERMILION රතු වර්ණය මූලික කරගත් වර්ණ මාලාවක් භාවිතා කරන්න.

## 'ඉ' ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

08. අකුණු සැරවලින් ආරක්ෂා වීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා සුදුසු පෝස්ටරයක් නිර්මාණය කරන්න. සුදුසු වැකියක් ද ඔබට අභිමත පරිදි යොදන්න.
09. සැඟවී ගිය ඉපැරණි රාජ්‍යයක තොරතුරු සොයා ගවේෂණයක යෙදුණු යොවුන් මිතුරු මිතුරියන් පිරිසකගේ වික්‍රමාන්විත ගවේෂණය තේමා කරගෙන ලියවුණු පුවත්පතක කොටස් වශයෙන් පලවන යොවුන් නවකථාවක් සඳහා සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරන්න.
10. ඔබ පාසලේ අලුතින් ආරම්භ කිරීමට නියමිත සෞන්දර්ය සංගමය සඳහා පරිගණක මෘදුකාංග මගින් නිර්මාණය කිරීමට සුදුසු ලාංඡනයක් සැලසුම්කර නිර්මාණය කරන්න. ඔබට අභිමත පරිදි වර්ණ භාවිතා කරන්න.

**තෙවන වාර පරීක්ෂණය 2019 චිත්‍ර කලාව II පත්‍රය - ආදර්ශ චිත්‍ර සටහන**

**மூன்றாம் தவணைப் பரீட்சை – 2019 சித்திரக்கலை – பகுதி II – மாதிரி பத்திரம்**

**13 ශ්‍රේණිය – தரம் 13**

**ද්‍රව්‍ය බලා ඇඳීම**

**අවශ්‍ය ද්‍රව්‍ය**

- වතුර බොන වීදුරුවක් (අඩක් කහ පාට ජලයෙන් පුරවන්න.)
- අරලිය මල් සහිත අත්තක්
- පොල් බෑවක්
- කුඩා කළගෙඩියක්
- ආවරණය කරන ලද බිස්කට් පෙට්ටියක්
- කොටු සහිත සර්වියට් එකක්
- ද්‍රව්‍ය තැබීමට ආධාරකයක්

ஒழுங்குபடுத்த வேண்டிய பொருட்கள்

- தண்ணீர் குடிக்கும் கண்ணாடி குவளை (வர்ணம் கலந்த தண்ணீருடன்)
- அரலிய மலர் கொப்பு
- தேங்காய் பாதி
- சிறிய குடம்
- கடதாசியால் சுற்றப்பட்ட காட்போட் பெட்டி
- சதுரங்களைக் கொண்ட சேவியட்
- பொருட்களை வைக்கும் ஆதார பலகை.



**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**තෙවන වාර පරීක්ෂණය - 2019 - 13 ශ්‍රේණිය**
**චිත්‍ර කලාව I**
**ලකුණු දීමේ පටිපාටිය**

---

**I කොටස**

| | | | |
|---|---|---|---|
| **01.** - 4 | **11.** - 5 | **21.** - 3 | **31.** - 5 |
| **02.** - 2 | **12.** - 1 | **22.** - 1 | **32.** - 1 |
| **03.** - 3 | **13.** - 3 | **23.** - 5 | **33.** - 1 |
| **04.** - 5 | **14.** - 4 | **24.** - 3 | **34.** - 4 |
| **05.** - 1 | **15.** - 2 | **25.** - 2 | **35.** - 2 |
| **06.** - 2 | **16.** - 4 | **26.** - 4 | **36.** - 1 |
| **07.** - 5 | **17.** - 2 | **27.** - 3 | **37.** - 5 |
| **08.** - 4 | **18.** - 3 | **28.** - 4 | **38.** - 2 |
| **09.** - 4 | **19.** - 2 | **29.** - 5 | **39.** - 4 |
| **10.** - 5 | **20.** - 1 | **30.** - 1 | **40.** - 1 |

(එක් පිළිතුරකට ලකුණු 1 බැගින් මුළු ලකුණු 40)

**II කොටස**

01. (i) මහාමායා දේවියගේ සිහිනය, සරණ මංගල්‍යය

(ii) * 20 වන සියවසේ මුල් භාගයේ ලංකාවේ ජනප්‍රියම විහාර සිත්තරාය
* යුරෝපීය ස්වභාවිකවාදී චිත්‍ර සම්ප්‍රදායේ ලක්ෂණ අනුගමනය
* එළිය - අඳුර දැක්වීම, ත්‍රිමාණ ලක්ෂණ, පර්යාවලෝක මූල ධර්ම භාවිතය
* යුරෝපීය ක්‍රමවේද සහිත වුවත් සිතුවම්වල ගොඩනැගිලි සහ වස්ත්‍රාභරණ ඇඳ ඇත්තේ ඉන්දීය කලා ලක්ෂණ සහිතවය.
* සෞම්‍ය වර්ණ භාවිතය, වර්ණවල දීප්තිමත් බව.
* එතෙක් පැවති ශෛලිගත විහාර සිතුවම්වලට වඩා ආකර්ෂණීය බව.

(iii)* 20 වන සියවසේ ශ්‍රී ලාංකීය නූතන බෞද්ධ බිතු සිතුවම් කලාව පෙරදිග කලා මූලාශ්‍රයන් ගුරු කොටගත් සම්ප්‍රදායක් බවට පත් කිරීමේ පුරෝගාමියා සෝලියස් මෙන්ඩිස් ය.
* කැළණි විහාරයේ නූතන බිතු සිතුවම් ඔහුගේ විශිෂ්ටතම නිර්මාණයි.
* අජන්තා, භාග්, තිවංක පිළිමගෙය ආදී පෙරදිග රීතින් අනුගමනය කර ඇත.
* අනුකාරකයකු නොවී නව කලා ශෛලියක් කැළණි සිතුවම් සඳහා භාවිතා කර ඇත.
* ශාන්ති නිකේතනයෙන් ක්‍රමවත්ව අධ්‍යාපනයක් ලබා ඇති අයෙක් ලෙස සෝමබන්දු විද්‍යාපති හැඳින්විය හැක.
* නන්දලාල් බෝස්ගේ ආභාෂය සෝලියස් මෙන්ඩිස් ශිල්පියාට වඩා හොඳින් උකහා ගත් බව බෙල්ලන්විල මානව රූප සාක්ෂි දරයි.
* රේඛාව, රේඛාවේ ලාලිත්‍ය ඉතා උපරිම ලෙස යොදාගත් ශිල්පීන් දෙදෙනෙකි.
* කැළණි විහාරයේ යක්ෂ දමනයත්, බෙල්ලන්විල විහාරයේ මාර පරාජයක් යන චිත්‍ර දෙකෙහි බුදු රැස්හි තේජස නිසා ඇතිවන භීතිය, වේදනාවෙන් තෙරපීම දක්වා ඇත.
* සෝලියස් මෙන්ඩිස් ගේ සවිස්තර සියුම් රේඛා කරණයේ විශිෂ්ට බවත්, සෝමබන්දු විද්‍යාපතිගේ රේඛාවේ පැහැදිලිම ලාලිත්‍යයත් දෙයාකාරයකින් සුන්දර බව ඉස්මතු කරයි.
* කැළණියේ නූතන චිත්‍රයට වඩා සෝමබන්දු ශිල්පියාගේ චිත්‍රවල වර්ණ මාලාව සෞම්‍ය බවින් අනූනය.
* එළිය අඳුර භාවිතයේ දී සෝලියස් මෙන්ඩිස් ශිල්පියා අති විශිෂ්ටය.
* ශිල්පීන් දෙදෙනාගේම මානව රූපවල උස් බව, අත් පාවල දිගටි බව සමානතාවයක් වුවත්, ස්වභාවික ඉරියව් සහිත හැඩතල කැළණි චිත්‍රයේ දී කැපී පෙනේ.
* සෝලියස් මෙන්ඩිස් ශිල්පියාගේ චිත්‍රවල ඇති සවිස්තරාත්මක ලක්ෂණ සෝමබන්දු විද්‍යාපති ශිල්පියාගේ චිත්‍රවල දක්නට නැත.
* අඳුරු වර්ණ භාවිතය කැළණි චිත්‍රවල වැඩි වශයෙන් දක්වා ඇත. බෙල්ලන්විල සරණ මංගල්‍ය චිත්‍රයෙහි ඇත්තේ ඉතාමත් සෞම්‍ය වර්ණ මාලාවකි.
* සෝමබන්දු විද්‍යාපති ශිල්පියාගේ බෙල්ලන්විල විහාර චිත්‍රවල ඇත්තේ පැහැපත් වර්ණ මාලාවෙන් දැක්වෙන සුමුදු බව වන අතර, කැළණි විහාරයේ සෝලියස් මෙන්ඩිස් ශිල්පියාගේ චිත්‍රවල ස්වභාවිකත්වය නිසා මැවුණු රේඛාවේ විශිෂ්ටත්වය කැපී පෙනේ.

02. (i) පොළොන්නරුව ගල් විහාරයේ හිඳි පිළිම, හිටි පිළිමය, සැතපෙන පිළිමය, පොළොන්නරුව වටදාගේ බුද්ධ ප්‍රතිමා.

(ii) * පොළොන්නරුවේ පරාක්‍රම සමුද්‍රය අසල පොත්ගුල් විහාරය ඉදිරිපිට පිහිටි ගලක අධි උන්නත ක්‍රමයට නෙලා ඇත.

* ත්‍රිභංග ඉරියව්ව, වම් කකුලට ශරීරයේ බර දී ඇත.
* සමස්ත ප්‍රතිමාව ප්‍රතාපවත් බවෙන් යුක්තය.
* දෑතෙහි ඇති වස්තුව දෙස කල්පනාකාරීව බලා සිටී.
* ළය පෙදෙස දක්වා වැටී ඇති යටි රැවුලකි.
* උඩු රැවුලක්ද සහිතය.
* රැළි සහිත දෝතිය වැනි යටිකය ඇඳුමකි. එහි ද්විත්ව රේඛා දක්වා ඇත. ඉදිරියට ගැටයක් දමා බැඳ ඇති අයුරින් යුතු බඳ පටියකි.
* හිසෙහි උස් වූ මකුටයකි.
* ආභරණ, ඉරියව් සහ ප්‍රතාපවත් බව ආදිය නිසා පැරකුම් රජුගේ පුලස්ති ඍෂිවරයාගේ, කපිල හෝ අගස්ති ඍෂිවරයාගේ බවට මතවාද කීපයකි.

(iii)* පොළොන්නරු යුගයේ ඇති වූ චෝල බලපෑම්, ගම්පොල යුගයේ සිට මහනුවර යුගය තෙක් වූ බුද්ධ ප්‍රතිමා කෙරෙහි ද බලපෑම් කර ඇත.

* ගම්පල යුගයේ පිළිම තැනීමේදී මාධ්‍ය ලෙස ගඩොල් සහ බදාම යොදා ඇත. නුවර යුගයට අයත් දඹුලු රජ මහා විහාරයේ පිළිමද සමහරකට එම මාධ්‍යම යොදා ඇතත්, බොහෝ පිළිම දැව කඳන් වලින් ද නිම කර ඇති බව කිය වේ.
* ගම්පොළ යුගයේ බුදු පිළිමවල බුදුන් වහන්සේගේ ආධ්‍යාත්මික ගුණ මතු කිරීමට වඩා බාහිර ලක්ෂණ පෙන්වීමට උත්සාහ ගෙන ඇත. විවෘත දෙනෙත්, ඍජු දැඩි කාය ස්වරූපය හා සිවුරේ රැලි තරංගාකාරව දැක්වීම විශේෂය.
* එම පිළිම වලට වඩා දඹුළු විහාරයේ ප්‍රතිමාවල මුහුණේ සෞම්‍ය ලක්ෂණ ප්‍රකට කරයි.
* යුග දෙකෙහිම ප්‍රතිමාවල උස් වූ සිරස්පත දැක්වීම පොදු ලක්ෂණයකි.
* විශාල රැස් වළල්ලක් ගඩලාදෙනි විහාරයේ පිළිමවල යොදා ඇත. ලංකාතිලක විහාරයේ ප්‍රතිමාවට පිටුපස ඇති මල් ලියකම් සහිත මකර තොරණ සුවිශේෂය. එක් එක් යුගවලදී බුද්ධ ප්‍රතිමාවල සුවිශේෂ බව ඉස්මතු කිරීම සඳහා මෙම අංග එකතු කරන්නට ඇත.
* වීරාසන ක්‍රමයට වැඩ හිඳියි සිවුර ඒකාංශය.
* දෙතොල් හා දෙනෙත් හි විශාල බව ගම්පල යුගයේ පිළිමවල දැකිය හැකි අතර, ගඩලාදෙණියේ ප්‍රතිමාවල එය වැඩි වශයෙන් දැකිය හැක. පිළිමයෙහි රළු පෙනුමක් එමගින් දිස් වේ.
* දෙගල්දොරුව, රිදී විහාරය, දඹුලු විහාරයේ පිළිම ආදියේ පිටුපස විශාලව රැස් මාලාවන් යෙදීම විශේෂිතය.
* මෙම යුගවල පිළිමවල උවිඩ දේව මූර්තිවල ලක්ෂණ යොදා ඇත.
* අනුරාධපුර, පොළොන්නරු යුගවල කළුගල් වලින් නෙලූ බුදු පිළිමවල මෙන් නොව තද පැහැති දීප්තිමත් වර්ණ ආලේප කිරීම මගින්ද බුදු පිළිමයේ භාවාතිශය හැඟීම් මතුවීමේ ගුණයෙහි අඩුවක් දැකිය හැක.

## ආ කොටස - ඉන්දීය කලාව

03. (i) ථූපාරාමය, රුවන්වැලි සෑය, අභයගිරිය, ජේතවනාරාමය, රන් කොත් වෙහෙර.

(ii) * චෛත්‍යයකට ආරක්ෂාව හා අලංකාරය සලසන ආධාරකයක් ලෙස නිර්මාණය කර ඇත.

* වාහල්කඩ මුහුණත් 5ක් සහිතය.
* විශාල දාගැබ්වල ගර්භය හා සම්බන්ධව පේශා වළලුවලට පහලින් සතර දිශාවට මුහුණ ලා නිර්මාණය කර ඇත.
* වාහල්කඩ දෙකෙළවර විසිතුරු කැටයම් සහිත උස ගල් කණු දෙකකි. එම කණු මත ඇත්, අස්, ගව, සිංහ රූ පිහිටුවා ඇත.
* මුහුණත්වල තිරස් අතට බොරදම් තීරු සහිතය. ඒවායේ අලංකාරය පිණිස වාමන, හංස හා ඇත් රූ කැටයම් සහිතය.
* වාහල්කඩ පිළිබඳ පූර්ණ අදහසක් ලබාගත හැකි වන්නේ රුවන් වැලි සෑ වාහල්කඩ වලිනි.
* දැනට ශේෂව පවතින පැරණිම හා කලාත්මක වාහල්කඩ මිහින්තලේ කණ්ඨක චෛත්‍යයේ නැගෙනහිර වාහල්කඩ බවට පිළිගැනේ.

(iii)* සඳකඩ පහණ යනු පැරණි ගොඩනැගිලි ප්‍රවේශ දොරටුවල පියගැටපෙළ ආරම්භක පඩියක් මෙන් යෙදූ කැටයම් සහිත ගල් පුවරුවකි.

* මුල් කාලීන සඳකඩ පහණ නිර්මාණ හතරැස් හැඩැති කැටයම් රහිත ගල් පුවරුවකි.
* පසුව ක්‍රමයෙන් අර්ධ වෘත්තාකාර හැඩයකි. එයද කැටයම් රහිතය.
* කැටයම් තීරු අතර බොරදම් සහිතය.
* ඇත්, අස්, ගව, සිංහ තීරුවක් ද, පලාපෙති, ගිනිදැල්ල, හංසාවලිය, ලියවැල් හා පද්මය කැටයම් අතර වේ.
* පොළොන්නරු යුගයේ දී සඳකඩ පහණේ සත්වාවලියෙන් ගවයා ඉවත් විය.
* අනුරාධපුර සඳකඩපහණේ සත්වාවලිය දක්ෂිණාවෘත්තව එකා පසුපස එකා බැගින් ගමන් කරයි.
* මහනුවර යුගයේ දී සඳකඩපහණ ත්‍රිකෝණාකාර හැඩයකට ආසන්න හැඩයක් ගෙන ඇත. තීරු ඉවත්ව, මධ්‍යයේ පූර්ණ නෙළුමක් ද, සත්ව රූ වෙනුවට ලියවැල්ද යොදා ඇත.

* කලාත්මක බවින් උසස්ම සඳකඩ පහණ අනුරාධපුර යුගයේ සඳකඩපහණ බව අවිවාදයෙන්ම පිළිගත හැක.
* සත්වාවලිය හා හංස රූවල සජීවී බව හා ස්වභාවික බව, ලියවැල් රටාවල ප්‍රාණ පූර්ණ රේඛාවේ ලාලිත්‍යය, කලාත්මක බව ඉතා ඉහළය.
* අනුරාධපුර බිසෝ මාළිගයේ සඳකඩ පහණ එම යුගයේ කලාත්මකම සඳකඩ පහණයි.
* පොළොන්නරු සඳකඩ පහණේ සතුන් වෙන්ව තනි තීරුවල ගමන් කළත්, ගවයා ඉවත් වුවත්, පොළොන්නරුව වටදාගෙය, කිරි වෙහෙර, බද්ධ සීමා ප්‍රාසාදය වැනි තැන්වල එම යුගයේ අලංකාරම සඳකඩ පහණ දැකිය හැක.
* ආකෘතිය වෙනස් වුවත්, අලංකාර ලියවැල් රටා සහිත මහනුවර යුගයේ සඳකඩ පහණේ යොදා ඇති කැටයම් අලංකාරය. මහනුවර යුගයට ආවේණික අලංකාර උද්භිද මෝස්තර සජීවීව හා කලාත්මකව කැටයම් කර ඇත.
* අනුරාධපුර සඳකඩ පහණ සඳහා බෞද්ධාගමික වශයෙන් අර්ථයක් දී ඇති අතර, එම අර්ථ අනෙකුත් යුගවලදී අඩු වුවත්, එම යුගවලට ආවේණික කැටයම් අනුව සඳකඩ පහණ කලාත්මක බව සඳහන් කළ යුතුය.
* මහනුවර දළදා මාළිගාව හා හඟුරන්කෙත පොත්ගුල් විහාරයේ සඳකඩ පහණ එම යුගයේ කලාත්මක සඳකඩ පහණ ලෙස හැඳින්විය හැක.

04. (i) චාම් බව හා ජීවමාන බව, අඩවන් දෙනෙත්. මඳ සිනාව හා ප්‍රසන්න පෙනුම, ලඹ සවන් හා ඌර්ණ රෝම ධාතුව.

(ii) * අමරාවතිය ආන්ද්‍ර දේශයේ පිහිටි ප්‍රධාන බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයකි.
* ගෘහ නිර්මාණ, කැටයම් හා මූර්ති ශිල්පය අතින් අමරාවතී කලාව වැදගත් වේ.
* අමරාවතී චෛත්‍ය බිත්තියට සම්බන්ධ කොට තිබූ කැටයම් පුවරු හා චෛත්‍ය වටා වූ ගල් වැටෙහි කැටයම් රැසක් නටඹුන් අතර තිබී ඇත.
* ලා කොළ පැහැයට හුරු සුදු හුණු ගල් විශේෂයක් මේ කැටයම් සඳහා යොදාගෙන ඇත.
* වස්තු විෂය ලෙස ජාතක කතා හා බුද්ධ චරිතයේ සිද්ධි යොදා ඇත.
* මුල් කාලයේ දී බුදුන් වහන්සේ වෙනුවට සංකේත යෙදූ අතර, පසුව බුදුරුව යොදා ඇත.
* වෘත්තාකාර, සමතුරස්‍රාකාර හා ආයත චතුරස්‍ර හැඩ සහිත ගල් පුවරුද, වැටෙහි කණු ද කැටයම් සඳහා යොදා ගෙන ඇත.
* කැටයම්වල තලය හා අවකාශ භාවිතයේ කුසලතා කැපී පෙනේ.
* සිද්ධිවල වැදගත් අවස්ථා පමණක් කැටයම් කර ඇත.
* භාව ප්‍රකාශනය උසස්ය. සාංචි කැටයම්වලට වඩා සියුම් මටසිලිටි හා ලාලිත්‍යමය බවකින් යුතුය.
* අල්ප උන්නත කැටයම් බහුලය.
* මානව රූප ස්වභාවිකත්වයට වැඩි නැඹුරුවක් සහිතව නිරූපණය කර ඇත.
* රූප දිගටිය. ඇඳුම් චාම්වද, ආභරණ අඩුවෙන් ද දක්වා ඇත.
* රූප එකිනෙකට වැසී ඇති අයුරුද දක්වා ඇත.

(iii) * අමරාවතී කැටයම් අතර ඇති නාලාගිරි දමනය වෘත්තාකාර ගල් පුවරුවක කර ඇත.
* තලය මත කර ඇති මනා සම්පිණ්ඩනය අගය කළ හැකිය.
* රාබී මත් වූ නාලාගිරි ඇතුගේ ප්‍රචණ්ඩ බව, මිනිසුන්ගේ කලබලකාරී හා බිය වූ ස්වභාවය, ඇතුන්ගේ මස් පිඩුවල චලන ස්වභාවය දක්වා ඇත.
* සන්සුන් ඉරියව් සහිත බුදුන් වහන්සේ අබියස ඇතු දණ ගසා කීකරුව සිටී.
* අවකාශය පිරෙන සේ හැඩතල සම්පිණ්ඩනය කිරීම, වෘත්තාකාර තලයකට හැඩතල ගලපා ගැනීම, ගොඩනැගිලිවල කවුළු වලින් බලා සිටින බියපත් ජනතාව, තාත්විකව දක්වා ඇත.
* ''රාහුල කුමරු දායාද ඉල්ලීම'' ද වෘත්තාකාර ගල් පුවරුවක කැටයම් කර ඇත.
* තලය මධ්‍යයේ බුදුන්වහන්සේය. රිද්මානුකූල රැළි සහිත දෙවුර වැසූ සිවුරය. ප්‍රභා මණ්ඩලයක් ද සහිතය.
* බුදුන් වහන්සේට පුද පූජා වැඩුම් පිදුම් කරන කීප දෙනෙක් ද දක්වා ඇති අතර මානව රූපවල ඉරියව් මනා ලෙස දක්වා ඇත.
* මානව රූ සමූහයක් මෙම තලය මත සම්පිණ්ඩනය කර ඇත.
* රාහුල කුමරුගේ දායාද ඉල්ලීමේ සංසිද්ධිය මත මිනිසුන්ගේ හදවත් හි ඇති වූ සංවේදී බව දැක්වීමට ශිල්පියා උත්සාහ කර ඇත.
* කැටයම් පුවරුවක ''අභිනිෂ්ක්‍රමණය'' යයි නම් කර සංසිද්ධි කීපයක් කැටයම් කර ඇත.
* අසු විශාලව දක්වා ඇති අතර, ජංගම ශීලී ඉරියව්ව හොඳින් දක්වා ඇත.
* කැටයම්වල පැහැදිලි බවක්, මටසිලිටි බවක් දැක්වේ.
* මානව ඉරියව් කැටයම් කිරීමේදී අමරාවතී ශිල්පියා දක්වා ඇති විශිෂ්ට කුසලතාවය ''අභිනිෂ්ක්‍රමණය'' කැටයමේ මනාව පිළිබිඹු කර ඇත.

05. (i) කණිෂ්ක රජුගේ කාසිය, හෝර්ටි මන්දාර් බුදු පිළිමය, බ්‍රෙගම් පිළිමය, තක්තීබහීර් පිළිමය, දුෂ්කර ක්‍රියාව පිළිමය.

(ii) * ග්‍රීක සම්භවයක් සහිත කුෂාණ වංශිකයෝ ගන්ධාරය පාලනය කළ බැවින් ඔවුන්ගේ ප්‍රතිමාවල ග්‍රීක කලා ලක්ෂණ ඇතුලත්ය.
* මුහුණ ග්‍රීක ඇපලෝ දෙවිගේ මුහුණේ ස්වරූපය සහිතයි.
* දිගු දෙනෙත් මඳක් විවර වී ඇති අතර මනහර බව ඉස්මතු වේ.
* ලඹ සවන්ය, ඍජු නාසය සහිතය. දුෂ්කර ක්‍රියාව මූර්තියේ ඒ බව මනාව පැහැදිලි වේ.
* දෙතොල් සිහින්ව මූර්තිමත් කර ඇත.

* හිසකේ ස්වභාවික රැලි සහිතය. ලාලිත්‍යමය ස්වභාවය නිසා චමත්කාරය දනවයි.
* උෂ්ණීෂය විශාලව දක්වා ඇත.
* චීවරය ග්‍රීක ප්‍රභූ ඇඳුමට හා රෝම වංශාධිපතින්ගේ ටෝගාවට සමානය.
* චීවරයේ රැළි ඝනව ස්වභාවික ලෙස යොදා ඇත.

(iii)
* ගාන්ධාර ප්‍රතිමාවල පොදු ලක්ෂණයක් ලෙස භාව ප්‍රකාශනය අඩුය.
* දේව ප්‍රතිමාවල සුන්දරත්වය පිළිබිඹු කිරීමට ගත් උත්සාහය මුල් කාලයේ දී සාර්ථක නොවුණත්, පසුකාලීනව කරන ලද මූර්තිවල දේව රූපවල ඇති සුන්දරත්වය පිළිබිඹු වේ.
* ලඹ සවන්, ඌර්ණ රෝම ධාතුව, මුද්‍රා ආදිය දේශීය ලක්ෂණ සහිතය.
* බ්‍රෙගම් ප්‍රතිමාවේ දේශීය ලක්ෂණ නැඹුරුව ඇත.
* ඉහළට යන කෙස් වලින් උෂ්ණීෂය දක්වා ඇත.
* පරිමාණය පිළිබඳ එතරම් සැලකිල්ලක් දක්වා නැත. හෝර්ට්මන්දාර්, බ්‍රෙගම් ප්‍රතිමා එයට උදාහරණ වෙති.
* මථුරා කලාව ගන්ධාර කලාවට සම කාලීනය. ගුප්ත යුගයේ දී උසස්ම තත්වයට පත් වේ.
* ගාන්ධාර කලාවේ වූ බටහිරවාදී ලක්ෂණවලින් තොරව, දේශීය නිර්මාණ බිහි කිරීමට සමත්ව ඇත.
* පැරණි ඉන්දීය මූර්ති කලාවේ වූ යක්ෂ - යක්ෂණී රූපවල ආභාසය ඇතිව, දේශීය මානව ලක්ෂණ හා ආධ්‍යාත්මික ගුණාංග ප්‍රකට කෙරෙන බුදු පිළිම නිර්මාණයට මථුරා ශිල්පියා සමත්ව ඇත.
* චාම් හා ජීවමාන බවින් යුක්තය.
* ගාන්ධාර පිළිමවල නොමැති මඳ සිනහවක් මථුරා පිළිමවල ඇත.
* චීවරය විනිවිද පෙනෙ ඇඟට ඇලුණු ස්වභාවය සහිතයි.
* සිවුර යොදා ඇත්තේ එක් උරයක් වැසෙන අයුරිනි.
* ගාන්ධාර පිළිමවලට වඩා ආසන ක්‍රම, මුද්‍රා පැහැදිලිව දක්වා ඇත.
* කත්‍රා බුද්ධ ප්‍රතිමාවේ මුහුණ සොම්නස් සහගතය.
* පසුකාලීනව ගුප්ත කලා අභාෂය අනුව දේශීය ලක්ෂණ සහිත විශිෂ්ට ගණයේ හිටි පිළිමද මථුරා ශිල්පීන් නෙලා ඇත.
* ගාන්ධාර ප්‍රතිමාවල මෙන් නොව පරිමාණය පිළිබඳව සැලකිලිමත්ව ඇත.
* ධම්ම චක්ක මුද්‍රාව, අභය මුද්‍රාව, විතර්ක මුද්‍රාව ආදිය පැහැදිලිව යොදා ඇත.
* ප්‍රථමයෙන් බුදු පිළිමය නෙලීමේ ගෞරවය ගන්ධාර ශිල්පීන් සතු වුවත් අධ්‍යාත්මක ගුණ සහිත දේශීය ලක්ෂණවලින් යුතු බුදු පිළිමය නෙලීමේ ගෞරවය හිමි වන්නේ මථුරා ශිල්පීන්ටයි.
* ගුප්ත කාලවට අයත් හිටි පිළිමය අද්වීතීය ස්ථානයක් ගනී. දේහ ලක්ෂණ සුන්දරය, කඩවසම්ය. අලංකාර කැටයම් සහිත බුදු රැස් මාලාව ඉතා අලංකාරය. මධ්‍යයේ වූ නෙළුම් මලේ පෙතිවල සුමුදු බව, අලංකාර කැටයමින් යුතු රිද්මයානුකූල ලියවැල සියුම්ය. මථුරාවේ උසස්ම කලා කෘතිය මෙයවන අතර, ගන්ධාරයේ උස්ම කලා කෘතිය ලෙස ගන්ධාර බුද්ධ ප්‍රතිමා ශීර්ෂය දැක්විය හැක. එය ගන්ධාර කලාව පරිණතියට පත්වූ අවස්ථාවයි.

06. (i) චින්තකයා, කැලේ නගරයේ පුරවැසියෝ

(ii)
* නූතනවාදී මූර්ති බිහිකිරීමේ ලා වඩාත් වැදගත්ම දායකත්වයක් සැපයූ නිර්මාණ ශිල්පියා ප්‍රංශ ජාතික ඔගුස්ට් රොඩැංය.
* රොඩැංගේ නිර්මාණ අතුරින් බෙහෙවින් ජනප්‍රිය කෘතිය ලෝකඩින් නිමවා ඇති ''චින්තකයා'' මූර්තියයි.
* ඉතා ගැඹුරු කල්පනාවක නිරතව සිටින නග්න පුරුෂ රුවකි.
* වැලමිට සිය දණහිස මත තබාගෙන සිටින අයුරුව නිසා ශරීරය ඇඹරුණු විලාශයක් පෙන්නුම් කරයි.
* දැඩි, රළු, ශක්තිමත් ශරීරය මස් පිඬු මතු කරමින් දක්වා ඇත. කල්පනාවෙහි ඇති බැරෑරුම් බව මුහුණෙන් පෙන්වා ඇත.
* රැළි ගැසුණු නළලත, විශාල නාස් පුඩු, තදවුණු දෙතොල් ආදී මුහුණේ අංග මඟින් තියුණු ගැඹුරු චින්තන විලාසය මතුකර ඇත.
* මාධ්‍යය යොදා ගැනීම විශිෂ්ටය. පෘෂ්ඨය නිමාවක් නැති ස්වභාවයකින් රළු වයනයක් සහිතව දක්වා තිබීම. මූර්තියෙන් පෙන්වීමට අදහස් කරන භාව ප්‍රකාශනය තීව්‍ර කිරීමට සමත් ය.
* ''කැලේ නගරයේ පුරවැසියෝ'' ඔගුස්ට් රොඩැංගේ සමූහ මූර්තියකි.
* කැලේ නගරය බේරා ගැනිම සඳහා ජීවිත පූජා කිරීමට පෙරමඟ ගත් දේශප්‍රේමී පුරවැසියෝ 6 දෙනෙකි.
* මරණයට සූදානම්ව බෙල්ලේ කඹ බැඳගෙන, හිස් වැසුම් හා පාවහන් රහිතව ගමන් කරන අයුරකි.
* භාව ප්‍රකාශනයන් එකිනෙකට වෙනස් ය.
* ඉරියව් ස්වභාවිකය. එකිනෙකට වෙනස් ය.
* මානව රූපවල සමස්ත චලනය. ඉදිරියට ගමන් කරන ස්වරූපය සහිතය.
* එකිනෙකාගේ මුහුණුවල ඇති භාවමය තත්වයන් වෙනස්ය.
* මරණය සඳහා සූදානම් වූ නිර්භීත තීරණය සඳහා අභීතව ඉදිරියට යාමේ ලක්ෂණ සහිතව තාත්විකව නිර්මාණය කර ඇත.
* ජීව ප්‍රමාණයෙන් අඹන ලද මෙම මූර්තිය උපස්ථිතිවාදී ලක්ෂණ සහිතය.

(iii)* හෙන්රි මුවර් 20 සියවසේ නූතනවාදී මූර්තියේ වියුක්තවාදී ගමන් මඟ තීරණය කිරීම සඳහා දායකත්වයක් සැපයූ මූර්ති ශිල්පියෙකි.
* ඔහුගේ මූර්ති වියුක්ත හෝ අර්ධ වියුක්ත ලක්‍ෂණ සහිතය.
* ස්මාරක, උද්‍යාන මූර්ති ලෙස විවිධ ස්ථානවල ඇත.
* ''වැතිර ගත් ස්ත්‍රිය'' වියුක්තවාදයේ උපරිම ලක්‍ෂණ පෙන්නුම් කරන්නකි. ශරීරයේ ඇතැම් කොටස් ඉවත් කර යථාරූපී ස්ත්‍රී ශරීරය සරලීකරණය කළ ආකෘතියකි.
* ''රජු සහ බිසව'' මූර්තිය අසුනක වාඩි වී ඉදිරිය බලා සිටින ස්ත්‍රී සහ පුරුෂ රූප දෙකකි.
* කාය ව්‍යුහ ලක්ෂණ. පරිමාණ ලක්ෂණ දැඩි ලෙස අනුගමනය කිරීම.
* මානව රූප අර්ධ වියුක්තය.
* ඔගුස්ට් රොඩැං හා හෙන්රි මුවර් යනු නූතනවාදයේ පැතිකඩ දෙකකි.
* දෙදෙනාගේම මාධ්‍ය ලෝකඩය.
* රොඩැං උපස්ථිතිවාදී කලා ව්‍යාපාරයට සමගාමීව නිර්මාණකරණයේ නියැලුනද චින්තනය නිර්මාණශීලිය.
* ස්වභාවිකවාදයේ ගැඹුර විශිෂ්ට ලෙස පෙන්වීමට සමත්ව ඇත.
* චින්තකයා ගේ චින්තනයේ ගැඹුර හා ''කැලේ නගරයේ පුරවැසියන්ගේ නිර්භවය ඉදිරියට යෑම තාත්විකව පෙන්වීමට ලෝහ වැනි මාධ්‍යයක් භාවිතා කිරීමේ අභියෝගය ජය ගැනීමට සමත්ව ඇත.
* භාවමය හැඟීම් ප්‍රකාශනය හා මානව ඉරියව් මූර්තිමත් කිරීමේ විශිෂ්ටත්වය රොඩැං පෙන්වා ඇත.
* ''කැලේ නගරයේ පුරවැසියෝ ජීවිතය පරදුවට තබමින් ගත් තීරණය පිළිබඳ පසුතැවීමක් නොමැතිව තනි තනිව සිතිවලි මවා ගනිමින් ගමන් කරන ස්වභාවය ද ඉතාම තාත්විකය.
* නූතනවාදය වියුක්තවාදය නවතාවයකට ඉදිරිපත් කිරීමට හෙන්රි මුවර් සමත්ව ඇත.
* හැඟීම් පෙන්වීමක් නැත. එහෙත් හැඩතල සරල කරගෙන සකස් කළ මූර්ති අලංකාරය පිණිස භාවිතය සඳහා වඩාත් උචිතය.
* නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමම නරඹන්නාගේ සිත් ඇද ගැනීමට සමත්ය.
* ජොඩැංගේ මූර්තිවල හැඟීම්වල ගැඹුරත්, හෙන්රි මුවර්ගේ නිර්මාණශීලි බවේ අලංකාරයත් දෙකම ප්‍රේක්‍ෂකයාට අවශ්‍ය වේ.
* ජොඩැංගේ නිර්මාණ දෙස විවිධ කෝණවලින් බලා විවිධ අදහස් පරිකල්පන ඉදිරිපත් කළ හැකිය.
* හෙන්රි මුවර්ගේ මූර්තිවල නවතාවයේ ඇති කලාත්මක බව, හැඩතලවල වියුක්ත බව රසවිඳිය හැකිය.
* රස වින්දනය නමැති විෂයේදී දෙදෙනාම සමාජයට වැඩදායක යමක් කර තිබේ. සුන්දරත්වයෙන් අනූනය.
* චින්තනයේ ගැඹුරත්, සරල බවේ සුන්දරත්වයත් ප්‍රකට කළ මූර්ති ශිල්පීහු දෙදෙනෙකි.

07. (i) වසිලි කැන්දිනෙස්කි, පියේ මොන්ඩ්‍රියන්

(ii) * ''සංරචනය'' කැන්දිනෙස්කිගේ පරිණතවියුක්තවාදී සිතුවම් සඳහා නිදර්ශනයකි.
* කැන්වසය මත තෙල් සායම්
* අතිශයින්ම විචිත්‍ර වර්ණ මාලාවක් සහිතය. රතු, කහ, නිල්, දම්, තැඹිලි, සුදු හා එම වර්ණවල ප්‍රභේද රැසක් භාවිතා කර තිබේ.
* මෙම චිත්‍රය ඇඳීමේ ශෛලිය ''එසැණ'' චිත්‍ර යයි නම් කෙරේ.
* ''කෝණ අංක 247'' චිත්‍රයේ ස්වභාවික හැඩ නොමැත. ජ්‍යාමිතික හැඩ සහ තල භාවිත කර ඇත.
* ''ක්‍ෂණික හෝ එසැණ'' සංරචන චිත්‍ර ශෛලියට වඩා පූර්ණ වශයෙන් වෙනස්ය.
* මෙම ශෛලිය විසින් කාර්මික ලෝකය හඳුන්වා දුන් හැඩ උත්කෘෂ්ටත්වයට පත් කර ඇත.
* කාර්මික ලෝකයේ මූලික ලක්‍ෂණවන චලනය සහ වේගය නිරූපණය කර ඇත.
* ගණිතමය රේඛා රටා සහිතය.

(iii)* පියේ මොන්ඩ්‍රියන් ශිල්පියා මුල් කාලීනව උපස්ථිතිවාදී භූමි දර්ශන නිර්මාණය කළද, පසුකාලීනව රේඛා හා චතුරස්‍ර හැඩ පදනම් වූ ප්‍රකාශන විලාසයක් ගොඩනගා ගන්නා ලදී.
* සුදු පැහැ චිත්‍ර තලය කොටු රටාවක් සේ තිරස් හා සිරස් රේඛාවෙන් චතුරස්‍රාකාර ආකෘති මැවෙන සේ බෙදන ලදී.
* ''කහ, කළු, නිල්, රතු සහ අළු සංයෝජනය'' නමැති සිතුවම භූමි දර්ශණ සිතුවම් ඇසුරෙන් පැන නැගුනකි.
* තිරස්, සිරස්, හැඩතලවලට අමතරව ආනත මායිම් සහිත හැඩද එක්ව ඇත.
* රේඛා වර්ණ සහ තල අතර සුසංවාදයකි.
* ''රතු නිල් සහ කහ සංයෝජනය'' ද ආකෘතිය අතින් පෙර කී චිත්‍රයට සමානකම් ඇතත් වර්ණ භාවිතයේ දී වෙනස්කම් ඇත. හැඩතලයක් විශාලව හා වඩාත් ප්‍රභලව ඇඳ ඇත. එය රතු පැහැතිය. මුල් චිත්‍රයේ මෙන් ආනත හැඩ නැත.
* චතුරස්‍ර හා ආයත චතුරස්‍ර ද ඇත.
* දෙවන චිත්‍රයේ හැඩතල වටා ඇති කළු රේඛා ඝනකමැතිය. පැහැදිලි වර්ණ ගැලපීමක් හා රතු නිල් පැහැයන් නිසා I චිත්‍රයට වඩා කැපී පෙනෙන අලංකාරයක් හා දීප්තිමත් බවක් ඇත.
* චතුරස්‍රවල පරිමාණ වෙනස් කිරීම මත, ගැටුමක් ද , සුසංයෝගයක් ද දැකිය හැක.
* පැතලි වර්ණ භාවිතා කර ඇත. තද පැහැති වර්ණ අතරට සෞම්‍ය වර්ණ ද යොදා වර්ණවල දීප්තිය අඩුකර ඇත.
* වස්තුවල ත්‍රිමාණ බව සහ සෙවණැලි දැක්වීම ආදී ප්‍රකෘතිය අනුකරණය අතහැර සියල්ල තිරස් හා සිරස් චතුරස්‍ර බවට පරිවර්තනය කර ඇත.
* භූමි දර්ශණ හැඩතල පසුකාලීන ජ්‍යාමිතික චතුරස්‍ර හැඩ ගත්තද විචිත්‍ර බව නොඅඩුව ඇත.
* කලාකරුවාගේ අසීමිත නිර්මාණශීලි බව මතුව පෙනෙන චිත්‍ර දෙකකි.

## තෙවන වාර පරීක්ෂණය - 2019 - 13 ශ්‍රේණිය
## චිත්‍ර කලාව II - ලකුණු දීමේ නිර්ණායක
## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

අභිමංතාර්ථ

1. ස්වභාවික හා නිර්මිත වස්තූන්ගේ ස්වභාවය හා හැඩය තේරුම් ගැනීමේ හැකියාව හා සිද්ධාන්ත භාවිතය පිළිබඳ කුසලතාව හා ක්‍රම ශිල්ප භාවිතය මැන බැලීම.
2. රේඛා මාධ්‍ය භාවිතයෙන් වස්තූන් ගේ ගති ලක්ෂණ නිරූපණය වනසේ ප්‍රකාශ කිරිමේ හැකියාව හා සම්පිණ්ඩනය කිරීමේ හැකියාව මැන බැලීම.
3. වර්ණ භාවිතා කිරිමේ ක්‍රම ශිල්ප හා වස්තූන්ගේ ගති ලක්ෂණ මතුවන සේ වර්ණා භාවිතාය පිළිබඳ හැකියාව මැන බැලීම

II වන පත්‍රය සඳහා අපේක්ෂකයන් ඇඳ ඇත්තේ එක් වර්ණ චිත්‍රයක් පමණි. මෙයන් ද්‍රව්‍ය සමූහය ඇසුරින් යථාරූපී චිත්‍රයක් ඇද වර්ණ කර නිම කිරිම අපේක්ෂා කෙරේ. මේ සඳහා ලකුණු තීරණය කල යුතුවේ. එකිනෙක නිර්ණායකන් යටතේ තීරණයකට එළඹ ලකුණු තීරණය කළ මැනවි. මෙහිදී තම රුචිය අනුව චිත්‍රය ඇගයීමට භාජනය නොකළ යුතු අතර අපේක්ෂකයා ප්‍රදර්ශනය කර ඇති කුසලතා තේරුම් ගෙන එය පදනම් කරගෙන ඇගයීමෙ කල යුතුවේ.

ලකුණු දීමේ නිර්ණායක :-

01. ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත් ව සංරචනය කිරිමේ හැකියාව (ල. 20)
02. ද්‍රව්‍යයක්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරිමේ හැකියාව (ල. 20)
03. සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පර්යාන්තලෝකය,ත්‍රිමාණ ලක්ෂණ, ඇස්මට්ටම, අවකාශ භාවිතය) (ල. 20)
04. වර්ණ භාවිතය හා ගති ලක්ෂණ දැක්වීම. (ල. 20)
05. චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ථ නිමාව (ල. 20)

II වන ප්‍රශ්න පත්‍රය සඳහා හිමිවන මුළු ලකුණු 100

---

## තෙවන වාර පරීක්ෂණය - 2019 - 13 ශ්‍රේණිය
## චිත්‍ර කලාව III - ලකුණු දීමේ නිර්ණායක
## "අ" කොටස - චිත්‍ර සංරචනය

ලකුණු දීමේ පටිපාටිය:-

### III - පත්‍රය 'අ' චිත්‍ර සම්පිණ්ඩනය

1. තොරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේ දී ඊට උචිත වාතාවරණය හා පරිසරය ප්‍රකාශ කර ඇති අයුරුව (ලකුණු 20)
2. රේඛා හැඩතල ඇසුරින් මානව රූ ඇතුළු සියලු හැඩතල තලය මත සම්පිණ්ඩනය කර ඇති අයුරුව (ලකුණු 20)
3. සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පරිමාණ, පර්යාලෝකය, ත්‍රිමාණ ලක්ෂණ, ඇස්මට්ටම හා අවකාශ භාවිතය(ලකුණු 20)
4. වර්ණ භාවිතයේ දක්වා ඇති කුසලතාව (ලකුණු 20)
5. අනුගමනය කර ඇති ශෛලීය හා සමස්ත නිමාව (ලකුණු 20)

(ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු 100)

### III - පත්‍රය 'ආ' මෝස්තර හා සැරසිලි නිර්මාණය

1. මාතෘකාවට අදාල නිර්මාණ කාර්යයට උචිත අයුරින් (ලකුණු 20)
2. පාරිභාරික අවශ්‍යතාවයන්ට ගැලපෙන බව හා කර්මාන්තයට (ලකුණු 20)
3. රේඛා හැඩතල අර්ථවත්ව යොදා ගැනීමේ හැකියාව
4. උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව (ලකුණු 20)
5. විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය (ලකුණු 20)

(ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු 100)

### III - පත්‍රය 'ඉ' ග්‍රැෆික් නිර්මාණය

1. මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් නවතාවයකින් යුතුව සැලසුම් කිරීමේ හැකියාව (ලකුණු 20)
2. වාණිජමය හා සන්නිවේදන අවශ්‍යතාවන්ට ගැලපෙන බව හා කර්මාන්තයට උචිත බව. (ලකුණු 20)
3. රේඛා හැඩතල අර්ථවත්ව යොදාගැනීමේ හැකියාව (ලකුණු 20)
4. උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව (ලකුණු 20)
5. විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය (ලකුණු 20)

(ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු 100)